විශ්වජිත් සන්දේශ් සූරියබණ්ඩාර

සන්නස වෙනුවෙන්ම ලියන ආදරණීය ම නවකතාව



# සිහිනයක් වගේ....

## 2

"සල්ලි වැඩි වුණාම සමහරුන්ට පිස්සු හැදෙනවා ස්නේහා.. ඒ ලෙඩ වලට බෙත් නැහැ.. ඒ ලෙඩ හොඳ වෙන්නෙත් නැහැ.." මේනක කීවේ විදුලි සෝපානය අසළදී ය.

## ස්නේහාගේත් අකලංකගේත් කතාව



අකලංක ඔහු සිටියේ කල්පනා කරමින්ය. අතට ගත් තේ කෝප්පය දිහා බැලුවේවත් නැත.

"කල්පනා කරන්න එපා... දැන් ටිකක් නිදාගනින්.. මං රිපෝට් එක හදලා යවන්නං.." මේනක රහසින් මෙන් කීවේය.

"මේක දුර යයිද බං?" අකලංක අසන්නේ ස්නේහාට නෑසෙන සේ ය.

"දුර යයිද ගොඩින් බේරෙයිද කියන්නනං මං දන්නෙ නෑ පුතේ.. මං ඉතින් දොස්තර කෙනෙක් විතරනෙ.. ඒ ප්‍රශ්නෙ අහපං අර වීරයා වගේ ලෝයර් කෙනෙක්ගෙන්.. කොහොමත් උත් අද එයිනෙ උඹව බැහැ දැකලා යන්න"

"ඒ බූරුවා මාව අවුස්සාගත්තෙ නැත්නං මේ මොකුත් නැහැනෙ.." අකලංක කියන්නේ කෝපයෙනි.

"අපේ මේ අකලංකයා... දැන්වත් ඔය ලොකු කම ටිකක් හිතෙන් අයින් කර ගනින්.. උඹල පුරුදුවෙලාම ඉන්නෙ හැම මිනිහම උඹලට ඔලුව පාත් කරන්න ඕනෙ කියලනෙ.. උඹල කරන හැම දහදුරා වැඩක්ම ඉවසගෙන ඉන්න ඕනෙ කියලනෙ.. ඒත් ඒහෙම ඉවසන්නෙ නැති මිනිස්සු දෙතුන් දෙනෙක් හරි මේ සමාජෙ ඉන්නවා කයන එක කල්පනා කරපං.. යකෝ සල්ලි වලට හුඟක් දේ කරන්න පුලුවන් තමයි.. ඒත් සල්ලි වලට නැවෙන්නෙ නැති එවුන් තාමත් මේ සමාජයේ ඉන්නවා.. ඒ පාඩමවත් මේ ඉන්සිඩන්ට් එකෙන් ඉගෙන ගනින්"

අකලංක ඉවත බලාගන්නේ ඒ කතාව හිතට අල්ලන්නේ නැති නිසා ය. නුරුස්නා කම ඈත සිටිනා ස්නේහාටද ඔහුගේ මුහුණෙන් පෙනෙයි.

"උඹ ඉතින් අහක බලා ගනින්.. උද්ධච්ඡ කම ඉහවහා ගිහිල්ලනෙ හිතේ.. මං යනවා.. කොයි වෙලේ හරි පොලීසියෙන් එයි.. එයිට කලියෙන් වීරයාට කතා කරපං.. ඌ පොඩි වැඩි නං අල්ලපං නමක් තියෙන එකෙක්.. පොල් ගහ කොස් ගහ කරන්න පුලුවං ලෝයර්ලා ඔය ඕනෙ තරං ඉන්නෙ.." මේනක ඒ කතාව අවසන් කරන්නේ ස්නේහා දෙස බලමින් ය. ".. අපි යං එහෙනං ස්නේහා.. ඔයාටත් මාත් එක්කම පහළට යන්න පුලුවන්.."

පහළට යන්නට තවත් කවුරුවත් අවශ්‍ය නැත . "හරියට ලිෆ්ට් එක එලවන්නෙ ඩොක්ටර් මේනක වගේනෙ ඒ කතාව.." ස්නේහා සිතුවාය. ".. හිතවත් කමට කියන්න ඇති..." දෙවනුවට හිතුණේ එහෙමය.

ස්නේහා කොරිඩෝව දිගේ මේනක පසුපසින් ගමන් කළාය. අතර මගදී මේනක නැවතී බලා සිටියේ ඇය තමා සමග එක පෙළට එන තෙක්ය.

"ඔයා නිතරම ඒ කාමරේම ඉන්න ඕනෙ නැහැ ස්නේහා.." ස්නේහා තමා සමග එක පෙළට ආ පසුව මේනක කීවේය. "...සැරින් සැරේ ගිහින් අවශ්‍ය දෙයක් බලල කරල එන්න.. අකලංකට නර්ස් කෙනෙක්ගෙ සාත්තුවක් අවශ්‍ය නැහැ.."